හස්ව ඔවුන්ගේ සමාන හා පරස්පර අදහස් සාකච්ඡා කර එකඟතාවයකට ඒමට මේ තුළින් ඉඩ ලැබේ.

මහවැලි ව්‍යාපාරයේ දක්නට ලැබෙන තවත් විශේෂ අංශයක් නම් ගොවි පුහුණුවයි. මෙහිදී ගොවි නායකයින්, නිශ්චිත අරමුණු හතරක් එනම්, 1. ජල පාලනය, 2. කෘෂිකර්මය, 3. ප්‍රජා සේවා 4. ණය සහ අලෙවි කරණය ඔස්සේ පුහුණු කරවීමේ වැඩ පිළිවෙලක් වර්ෂ කීපයක සිට ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ගොවි නායකයින් (මහවැලි ව්‍යාපාරයේදී ඔවුන් හඳුන්වනුයේ අවිහැරවුම් නායකයින් වශයෙනි.) ගොවි පුහුණු මධ්‍යස්ථාන වලදී ලබා ගත් දැනුම පුළුල් ලෙස බෙදා හැරීමට ප්‍රජා සංවර්ධන සමිති රැස්වීම් ප්‍රමෝජනයට ගනී. ආධාර බෙද හැරීමට වඩා විශේෂ කටයුත්තක් මෙහිදී ඒ සමිති වලින් අපේක්ෂා කරයි. එනම්, ආධාර නොමිලේ හෝ පිනට දෙන්නක් නොව සංවර්ධන ක්‍රියා වලියක් ගොඩ නගා ගැනීමට අනදීමක් පමණක් බවත්, මහවැලි දියෙන් රට සරුවනු දැකීමට, මුලුරටේම ජනතාව මහවැලි ව්‍යාපාරය ගැන බලාපොරොත්තු තබා ගෙන ඇති බැවින් ගොවීන්ට ඒත්තු ගැන්වීමයි.

වනිතා ලතා

# වම්බටු කල් තබා ගනිමු

වම්බටු ඉක්මනින් නරක් වන සුළුය. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ එළවළු වාරයට මේවායින් ඉතා විශාල අස්වැන්නක් ලබා ගත හැකිය. එක් කන්නයකදී පමණක් බහුලව ඇතත්, සමහර කාලවලට වම්බටු හිඟය. වම්බටු වාරයේදී ඒවායේ මිල ඉතා පහසුය.

හිඟ කාලයේදී පාරිභෝගිකයිනට මිලදී ලබා ගත හැකිවූත්, පොලිතින්වල අසුරා පිටරට යැවීමට හැකිවූත්, පහසු ප්‍රයෝජනයට ගත හැකි හා කල් තබාගත හැකි ක්‍රමයකි වම්බටු වියළීම.

**නිෂ්පාදන ක්‍රමය**

තෝරාගත් බටුදිග අතට අඟලේ හෝ අඟල් 1 1/2 කැලිවලට කප. සෝදා කලාලවල හෝ පිරිසිදු කර ගත් සිමෙන්ති බිමක තුනී කර හොඳින් වියළා ගතයුතු වේ. සේදීමේදී බටු කැබලිවල දිය සීරාව හොඳින් ඉවත් කළ යුතුවේ. හොඳින් වියලුනාට පසු පොලිතින් වල අසුරා වෙළඳපොළ මාර්ගයෙන් පාරිභෝගිකයනට අලෙවි කළ හැකිය.

**පිසීමේ ක්‍රමය**

පිසීමට පළමුව වියළි වම්බටු කැලි මඳඋණු දියෙහි විනාඩි 1/2 ක් පමණ පොඟවා ගත යුතුය. පසුව තෙලෙන් තෙම්පරාදු කිරීමහෝ උකු පොල් කිරි යොදා තෙලට සිදෙනතෙක් උයා ගත හැකිය. පිසීමේදී ලුණු, රම්පෙ, කරපිංචා, අමු මිරිස්, මිරිස් කුඩු, තුනපහ කුඩුද යොදා ගනු ලැබේ. වියළා වම්බටු පිසීමේදී අමු බටු පිස ගැනීමට යන කාලයත් ශ්‍රමයත් ඉතිරි කර ගත ගත හැකිය.

**නිගමනය**

වම්බටු වාරයේදී ඉතා අඩු මුදලකට විශාල වශයෙන් වම්බටු ලබා ගත හැකිවේ. වියළි වම්බටු සෑහෙන කලක් තබා ගත හැකිය. වම්බටු හිඟ කාලයට මේවා වැඩි මිළකට (විශේෂයෙන් නගරබද) අලෙවි කළ හැකිවේ. මෙය ගෘහ කර්මාන්තයක් වශයෙන් මතුවට දියුණු කළ හැකි කර්මාන්තයකි.


**ගොවි ජනතාව නිතිපතා ලබාගැනීමට දායක වන්න**

**වසරක දායක මිල රු: 5.00**